# මුගපක්ඛ ජාතකය

තවද එක්සමයෙක්හි සකල ජනහිත විධායක විසුඬ බුඬ ඇති කරුණා නිධානවූ සම්‍යක්සම්බුඬ සර්වඥරාජොත්තමයානන්වහන්සේ සැවැත්නුවර නිසා දෙව්රම්වෙහෙර වැඩවසනසේක් මේ මුගපක්ඛ ජාතක ධර්මදේශනාව තමන්වහන්සේගේ මහාභිනික්මන් අරභයාගෙණහැරදක්වා වදාළසේක.

එක් දවසක් දම්සභාවෙහි රැස්වඋන්නාවූ භික්ෂුහු බුදුන්ගේ මහාභිනික්මනෙහි ගුණ කිය කියා උන්නාහුය. සර්වඥයන්වහන්සේ එතැන්හි වැඩ මහණෙනි දැනි මා එන්නාට පූර්වභාගයෙහි මේ දම්සභායෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා නුඹවහන්සේගේ මහාභිනික්මනෙහි ගුණ කිය කියා උනුම්හයි කීකල්හි මහනෙනි, දැන් පුරනලද බොධිසම්භාර ඇති මා විසින් රාජ්‍යසම්පත්තිය හැර මහාභිනික්මන්කළ නියාව ආශර්වයඝ්නෙවෙයි මම වනාහි නුමුහුකළාවූ ප්‍රඥාඇතිකල්හිද දාන සිලාදිවූ සමතිස් පෙරුම් පුරන්නේ මේ රජසැපත් හැර මහාභිනික්මන් කෙළෙම්වේදැයි වදාරා ඒ මහනුන් විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉතුත්වත් ගෙණහැරදක්වා වදාළ සේක.

හේ කෙසේදයත්?

පෙරබරණැස්නුවර කසීනම් රජෙක් දැහැමෙන් රාජ්‍යකරන්නේය. ඒ රජුගේ සොළොස් දහසක් බිසෝවරුන් වුවාහුය. ඔහුන් අතුරෙන් එකද ස්ත්‍රීයක්හට දුවෙක් හා පුතෙක් නුපන්නේය. නුවරවාසීන් කියන්නාහුඅපගේ රජ්ජුරුවන් වහන්සේගේ වංශය රක්ෂා කරන්නාහු පුත්‍රයෙක් නැතයි කුස ජාතකයේ හි අවාහු ක්‍රමයෙන් රැස්ව රජහට කියන්නාහු පුතකු ප්‍රාර්ථනා කීයේය. ඒ ස්ත්‍රීහු  චන්ද්‍රසූර්‍ය්‍යාදීන්ට වැඳීම් පිදීම් ආදි වූ උපස්ථාන කොට පාර්ථනා කරන්නාහුද දරුවන් නොලද්දාහුය. බිසවක් ඇත. ඒ බිසවුන්ට දරුවන් ප්‍රාර්ථනා කරවයි කීයේය.

එකල්හි ඒ චන්ද්‍රාදේවීතොම පෞණීමී දිනයෙහි පෙහෙවස් සමාදන්ව මිටි ආසනයක සැතපෙන්නී තමාගේ සීලය පරික්ෂා කොට ඕතොමෝ සත්‍ය ක්‍රියා කරන්නී මම අඛණ්ඩකොට රක්ෂාකළ සිල් ඇත්තෙම්ද මේ සත්‍යවචනය හේතුකොටගෙණ මට දරුවෝ ඇති වෙත්වයි මෙසේ සත්‍යක්‍රියා කළහ.

ඇගේ සීලානුභාවයෙන් ශක්‍රභවනය උනුආකාරයෙන් දැක්වීය. සක්දෙවි රජ තෙම පරික්ෂා කොට ඒ කාරණය දැන චන්ද්‍රාදේවී පුතකුපැතීය. ඈට සුදුසු පුතකු බතනුයේ බෝධිසත්වයන් දුටුයේය. එකල බෝධිසත්වයන්වහන්සේ විසිදහසක් අවුරුදු බරණැස රාජ්‍යයකොට එයිනුත් චුතව ඔසුපත්නරකයේ උපන්සේක් අසූදහසක් අවුරුදු එහි පැසි තව්තිසාභවනයෙහි උපන්සේක.

ඒ දිව්‍යලෝකයෙහිද ජීවිතාන්තය දක්වා හිට එයින් චුතව මත්තෙහි දිව්‍ය ලෝකයෙහි උපදනා කැමතිවිය. ශක්‍රදේවේන්ද්‍ර තෙම උන්වහන්සේ සමීපයට ගොස් කියනුයේ යහළු තොප මිනිස් ලොව උපන්කල්හි තොපගේ පාරමිතාවන් පිරෙන්නනේය. මහජනයාට මහත්වැඩද වන්නේය. මේ කසීරජුගේ මේ චන්දා නම් අගමෙහෙසුන් බුසවුතොම පුතකු පතන්නී ඇගේ කුස පිළිසිඳගනුවයි කීයේය. එකල්හි මහ බොසතාණන් වහන්සේ සක්දෙවිරජුගේ වචනයන් පිලිගෙන පන්සියක් දිව්‍යපුත්‍රයන් හා සමඟ ඒ දිව්‍යලෝකයෙන් චුතව තමන් වහන්සේ ඒ චන්ද්‍රානම් අගමෙහෙසුන්කුස පිළිසඳගත්සේක. සෙසුදිව්‍යපුත්‍රයෝද අමාත්‍යයන්ගේ භාර්යාාවන්ගේ කුස පිළිසඳගත්තාහුය. බිසවගේ කුස විදුරුපිරුවාක් මෙන් වූයේය. ඒ බිසව්තොම ගැබ්පිහිටි බව දැන රජහට දැන්වූවාය. රජ ඒ බව දැන ගැබ්පෙරහැර දෙවුයේය. ඕතොමෝ පිරුණු දරුගැබ් ඇත්තීය. පින්ලකුණු ඇත්තාවූ පුතකු වැදුවාය. එදවස් ඇමැත්තන්ගේ ගෙට ලද පන්සියක් කුමරුවෝ උපන්නායි කී කල්හි රජ ඇමතිගණ පිරිවරා මතුමහල්තලයෙහි උන්නේය. ඉක්බිති ඒ රජරට ඒ කුමාරයා උපන්බව කීවාහුය. ඕහට එබස් අසාම පුත්‍රසෙනහ උපන්නේය. ඒ සෙනස’ සිවි ආදිය විනිවිඳ ගොස් ඇටමිදුළු පැහැර සිටියේය. චින්තාභ්‍යන්තරයෙහි ප්‍රීති උපන්නේය. ළය සිහිල් වූවේය. මාගේ පුත්‍රයාගේ ඉපදීමෙන් තෙපි සතුටුවුදැයි අමාත්‍යයන් විචාළේය. එසඳ අමාත්‍යයෝ කුමක් කියනසේක් ද දේවයන්වහන්ස? අපි පෙර පිහිටක් නැත්තම්හ. දැන්වනාහි පිහිටක් ලදුම්හ, අප විසින් හිමිකෙනෙකුත් ලබන ලදැයි කීවාහුය. මාගේ පුත්‍රයාට පිරිවර උවමැනයි එබැවින් අමාථ්‍යකුලයෙහි උපන් කුමරුවන් මෙතෙකැයි බලා නියමදැන එවයි වහා සේන ගුප්තය යනඅමාත්‍යයෙකුට නියෝග කළේය. ඒ අමාත්‍යතෙම පන්සියයක් කුමරුන් දැක අවුත් රජරට දැන්වීය. එසඳ රාජකුමාර සතුටුව පන්සියයක් කුමාරාභරණ ගමන්කරවා පන්සියයක් කිරිමවුන්ද ගමන්කරවි. ඉතා උස් ස්ත්‍රීන්ගේ ඇකයෙහි හිඳ කිරි බොන දරුවන්ගේ කලවා රිදෙන හෙයිද ඉතා තරවූ ස්ත්‍රියගේ ඇකයෙහි හිඳ කිරිබොන දරුවන්ගේ නාසා පැතලිවන හෙයින්ද සමහර ස්ත්‍රින්ගේ කිරිඇඹුල් රස හෙයින්ද සමහර ස්ත්‍රින්ගේ කිරි කුලුරස ආදිවූ වෙන වෙන රස ඇති හෙයින්ද මෙකී සියලු දෝෂ ඇති ස්ත්‍රීන් හැර මධුරවූ කිරිඇතිසේ

තනසිටි සිවුසැටක් කිරිමවුන් බොසතාණන්ට තොරා දී මහත්වූ සත්කාර කොට චන්ද්‍රා දේවීන්ට වරයක් දුන්නේය. ඒ චන්ද්‍රාදේවී තොම ඒ වරය කැමති විට ඇර ගනිමියි නොගෙන තිබුවාය. ඒ කුමාරයාට නම් තබන්නාහු දිනයෙහි ලක්ෂණ කියන්නාවූ බ්‍රාහ්මණයන්ට බොහෝ සත්කාර කොට ඹහට මතු උපද්‍රවයෙක් ඇද්ද නැද්දයි විචාළේය. ඔහු ඒ කුමාරයාගේ සාමුද්‍රිකා ලක්ෂණ සමුර්ධිය දැක මහරජ්ජුරුවන්වහන්ස, මෙතෙම පින් ඇති කුමාරයෙක. මෝඑක දිවයින තබා සතරමහදිවයින රාජ්ජ්‍යය කරන්නට සමර්ථවන්නේය. මෝහට වනාහි කිසි උපද්‍රවයක් නුදුටුම්හයි කීවාහුය. ඒ බමුණක් කී නිමිති අසා සතුටු වු රජ තෙම කුමාරයාට නම් තබන්නේ මොහු උපන් දවස්හී සියලු කසී රට තෙම වැසි වටුහෙයින්ද තමාගේ ද ඇමති ආදීන්ගේ ද සිත් මෙමින් උපන් හෙයින් තෙකමිය කුමාරයයි නම් තුබුවේය. ඉක්බිති එක්මැසි කුමාරයා සරහා රජුගේ සමීපයට ගෙණහියාහුය. රජතෙම ප්‍රිය වූ පුත්‍රයා බලා වඩාගෙන ඇකයෙහි හිඳුවා සන්තෝෂයෙන් සනහා උන්නේය එකෙණෙහි සොරුන් සතරදෙනෙකු ගෙනාහුයාය. රජ්ජුරුවෝ ඔවුන් අතුරෙන් එකකුට කටුසැමිටියෙන් දහසක් පාරදෙවයි කීය. එකෙකු ඇල්කීලෙවයි කීයේය. එකෙකුගේ අත් පා හරුවයි කීයේය. එකෙකු උල තබවයි නියම කලේය. මහ බොසතාණෝ පිය රජ්ජුරුවන්ගේ වධයෙදීම් අසා හයින් තැතිගෙණ මාගේ පිය රජ්ජුරුවන් වහන්සේ රාජ්‍යය නිසා නිරයගාමීවු බොහෝ අකුසල් කොට නැසෙන්නැයි සිතු සේක. දෙවැනි දවස් උන්වහන්සේ සේසතනය සරහන ලද ශ්‍රී යහන් මස්ත්‍රකයෙහි පිනවූවාය. ඒ කුමාර මදක් සැතපී පිබිදුනේය. ඇස්හයා සේසත් බලන්නේ මහත් ඓශ්වර්‍ය්‍යී දුටුයේය. ස්වභාවයෙන්ම අකුශලයෙහි භය ඇත්තාහු ඹහට ඒ ඓශ්වර්‍ය්‍යී දැක අධිකතරවූ භය උපන් නේය. ඒ රාජකුමාර තෙම මම මේ රජගෙට කොතැන්හි සිට ආයෙම්දැයි ජාතිස්මරණ ඥාණයෙන් බලනුයේ දිව්‍ය ලෝකයෙහි සිට ආබව දැන එයින් ඈතත් බලනුයේ නරකයෙහි පැසුනුබව දුටුයේය. එයිනුත් ඈත බලනුයේ එම නුවර රාජ්‍යය කළබව දුටුයේය. තුමුදු විසිවසරක් රාජ්‍ය  කොට එකල්හි සිද්ධවූ අකුශල යෙන් අසුදහසක් අවුරුදු නරකයෙහි පැසුනෙමි. නැවතත් දැන් මේ  සිර ගෙහිම උපනිමි. මාගේ පිය රජ්ජුරුවන් වහන්සේද ඊයේ දවස සොරුන් සතරදෙනකු ගෙනා කල්හි ඔවුන්ට කර්කශවූ තෙපුල් කියනුයේ තමාත් නරකයෙහි ඉපදීමට සුදුසුවූ බස් කීයේය.